**(ආ)** **1.** නිෂ්පාදිතයක ගුණත්වයට බලපාන අංගෝපාංග මොනවා ද? **(ලකුණු 01යි)**

**2.** තත්ත්ව ආරක්ෂණය යනුවෙන් කුමක් අදහස්වේ ද? **(ලකුණු 01යි)**

**(iii) (අ)** නිෂ්පාදන ආයතනයක ආර්ථික ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීමේ දී මුළු පිරිවැය, ඇණවුම් කිරීමේ පිරිවැය හා තොග පවත්වාගෙන යාමේ පිරිවැය කිනම් ස්වරූපයක් ගන්නේදැ යි ප්‍රස්තාර සටහනකින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** පිරියත සැලැස්මක් ස්ථාපිත කිරීමේ දී සලකා බලන කරුණු මොනවා ද? **(ලකුණු 02යි)**

**(iv) (අ)** පුහුණුව හා සංවර්ධනය තුළින් සේවා යෝජකයාට හා සේවකයාට අත්වන ප්‍රතිලාභ **දෙක** බැගින් සඳහන් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** යහපත් ශ්‍රමික සම්බන්ධතාවල ප්‍රයෝජන මොනවාදැ යි පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(v) (අ)** "මානව සම්පත් කළමනාකරුගේ බලතල සිරස් ලෙස හා තිරස් ලෙස ක්‍රියාත්මක වේ. මෙම තත්ත්වය අනෙකුත් කළමනාකරුවන්ගේ බලතල හා වෙනස් වේ." පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** රැකියා නිර්මාණය හා රැකියා විශ්ලේෂණය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

**8.** **(i) (අ)** "කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙන්, සමාගම්වලට නව ප්‍රාග්ධනය සම්පාදනය නොකරයි." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද යන්න හේතු දක්වන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ආයෝජන කළඹ යනු කුමක් ද? නිදසුනක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ii) (අ)** සීමිත සමාගමක අධිතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් සහ ඉහළ ලාභදායකත්වයක් පවතින විට, වඩා සුදුසු ණයකර නිකුත් කිරීමක් ද කොටස් නිකුත් කිරීමක් ද ? පැහැදිලි කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** ඌණකාරක ප්‍රාග්ධන තත්ත්වයක් අවම කර ගැනීමට ව්‍යාපාරයකට ගතහැකි ක්‍රියාමාර්ග මොනවා ද? **(ලකුණු 02යි)**

**(iii) (අ)** කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග **දෙකක්** නම් කරන්න. **(ලකුණු 02යි)**

**(ආ)** මිලංක මිල දර්ශකය වෙනුවට හඳුන්වා දුන් S&P ශ්‍රී ලංකා 20 දර්ශකය සකස් කිරීමට යොදාගත් අන්තර්ජාතික ප්‍රමිතීන් නම් කරන්න. **(ලකුණු 02යි)**

**(iv)** ශ්‍රී ලංකාවේ විවිධ ව්‍යාපාර ආයතන විසින් තම ආයතන පරිශ්‍රය තුළ **Wi-Fi** පහසුකම් නොමිලයේ ලබා දීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙම පහසුකම් ව්‍යාප්තවීම තුළින් ඒ ඒ ව්‍යාපාර ආයතනවලටත්, ගනුදෙනුකරුවන්ටත් ලැබෙන ප්‍රයෝජන වෙන වෙන ම සඳහන් කරන්න. **(ලකුණු 04යි)**

**(v) (අ)** මුදල් ප්‍රවාහ ප්‍රකාශය හඳුන්වා, එහි මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් සඳහා නිදසුන් **දෙක** බැගින් දක්වන්න. **(ලකුණු 03යි)**

**(ආ)** "ව්‍යාපාර සැලැස්මක් නොමැති ව්‍යාපාරය හබල බිඳුණු ඔරුවක් සේ ය." පැහැදිලි කරන්න. **(ලකුණු 01යි)**

**(මුළු ලකුණු 20යි)**

***

www.artsapi.lk